සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 33 S |
|---|---|---|

## ඉතිහාසය I - කොටස

නම ..............................................  කාලය පැය දෙකයි

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

✹ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියන්න.

01. දික්සඳ සෙනෙවියා පිරිවෙන්වාසී මහානාම හිමි විසින් ..........................................රචනා කරන ලදී. (බෝධිවංශය,මහාවංශය, දීපවංශය)

02. ශ්‍රී ලංකාවේ අකුරු ලිවීම ගැන අවුරුදු ....................................... පමණ ඉතිහාසයක් තිබේ. (දෙදහස් පන්සීයක, දෙදහස් තුන්සීයක, දෙදහස් දෙසීය පනහක)

03. මුස්ලිම්වරු .......................................... ක්‍රමයට අනුව තම ආගමික උත්සව පැවැත්වීමේදී කාලය නියම කර ගනී. (ශත වර්ෂ, හිජ්රා වර්ෂ, ක්‍රිස්තු වර්ෂ)

04. ගුරුගල් ඇටසැකිලිමත ආලේපකර අවමංගල්‍ය චාරිත්‍ර ඉටුකළේ ........................................ යුගයේදීය (නවශිලා, මධ්‍ය ශිලා, පුරාශිලා)

05. මිනිසාට තිබෙන නොයෙක් නොයෙක් දෑ තැනීමේ හැකියාව .................................. ලෙස හැඳින්විය හැකිය. (භාෂාව, කලාව, තාක්ෂණය)

✹ අංක 6-10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. පෘථිවිය සෑදී අවසන් වූ පසු එහි නිර්මාණය වූ ජීවයක් සහිත පළමු දෙය බැක්ටීරියාවකි (.................)

07. ලෝකයේ මුල්ම ජීවීන් බිහි වූයේ ගොඩබිමේය. (.................)

08. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇතිකළ පළමු වානරයා ඔස්ට්‍රලොපිතිකස්ය (.................)

09. පුරාශිලා යුගය අවසාන වන විට මිනිසා චිත්‍ර ඇඳීමටත් ගල් වලින් රූප සකස් කිරීමටත් දැන සිටියහ. (.................)

10. ලෝකයේ වී වගාව මුලින්ම ආරම්භ වූයේ මධ්‍යම මෙක්සිකෝ ප්‍රදේශයේය. (.................)

✹ අංක 11-15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11. පහත මූලාශ්‍ර අතරින් ඔබේ පාසලේ ඉතිහාසය හැදෑරීමට උදව්කරගත හැකි වඩාත් උචිත ලිඛිත මූලාශ්‍රය කුමක්ද?

1. නාමලේඛනය  2. ලොග්පොත  3. පාසල් සඟරා  4. ඇතුළත් කිරීමේ ලේඛනය

12. ක්‍රිස්තු වර්ෂ 2019 වර්ෂය බුද්ධ වර්ෂ වලින් දැක් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර පහත දැක්වෙන පිළිතුරු අතරින් තෝරන්න.

1. බු.ව. 2500  2. බු.ව. 2560  3. බු.ව. 2562  4. බු.ව. 2563

13. මානව පරිණාමයේදී හැකි මිනිසා ලෙස විරුදාවලිය ලද මානවයා කවුද?



LIVEWORKSHEETS

1. හෝමෝ ඉරෙක්ටස් 2. හෝමෝ හැබිලස්
3. හෝමෝ සේපියන් 4. හෝමෝ නියැන්ඩර්තාලෙන්සීස්

14. පින්තූරයෙන් දැක්වෙන්නේ මැටියෙන් කළ දෑකැත්තකි.

එය අයත් වන්නේ කුමන යුගයටද



1. පූර්ව ශිලා යුගය
2. පේලියෝසොයික යුගය
3. නව ශිලා යුගය
4. මධ්‍ය ශිලා යුගය

15. නීග්‍රොයිඩ් යනුවෙන් හැදින්වූයේ ලෝකයේ කුමන ප්‍රදේශ වලට ව්‍යාප්ත වු හෝමෝ සේපියන් වරුද?

1. අප්‍රිකාවට 2. ආසියාවට 3. චීනයට 4. ජපානයට

✹ **16-20 දක්වා ප්‍රශ්න වල A තීරුවට ගැලපෙන පිළිතුරු B තීරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16. පළමු වරට ගින්දර සොයා ගැනීම සිදුකළ රට | A ලෝහ |
| 17. මියගිය නෑදෑයින් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම | B ගුරුගල් |
| 18. සාරවත් දේ නිපදවූ මානවයා | C පූර්ව ශිලා යුගය |
| 19. වර්ණ සෑදීමට භාවිතා කළ ද්‍රව්‍යයකි | D හෝමෝ සේපියන් |
| 20. ගල් මෙවලම් වෙනුවට භාවිතා කළ මෙවලම් | E ඊශ්‍රායලය |
| | F හෝමෝ ඉරෙක්ටස් |



LIVEWORKSHEETS